ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය
தேசிய காப்புறுதி நம்பிக்கை பொறுப்பு நிதிய சபை
National Insurance Trust Fund Board
( පනත - சட்டம் - Act. No. 28 of 2006)

මගේ අංකය : NITF/FINANCE/11/2017 2017/02/06

සියළුම ආයතන ප්‍රධානීන් වෙත ,

**අග්‍රහාර රක්ෂණ ක්‍රමය**

2005 අංක 12/VI දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ කොන්දේසි ප්‍රකාරව නව වර්ගීකරණය කරන ලද රන් හා රිදී යෝජනා ක්‍රම යටතේ රක්ෂණ ප්‍රතිලාභ වැඩිකර ඇත. ඒ අනුව එක් එක් කාණ්ඩ යටතේ ලියාපදිංචි වී ඇති සියළුම අග්‍රහාර සාමාජිකයන් සඳහාම වෙන වෙනම සාමාජික ගිණුම් අප විසින් පවත්වාගෙන යනු ලැබේ. සාමාජික ගිණුම් සඳහා ප්‍රධාන හඳුනාගැනීම් ක්ෂේත්‍රය වන්නේ ජාතික හැඳුනුම්පත් අංකයයි. 850,0000ට වඩා වැඩි සාමාජිකයන් ප්‍රමාණයක් දැනටමත් මෙම අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ ලියාපදිංචි වී ප්‍රතිලාභ ලබමින් සිටී.

ජාතික රක්ෂණ භාර අරමුදලට ලැබෙන වාරික මුදල්, ඔබ ආයතනය විසින් ලබාදෙනු ලබන මාසික අවකරණ ලැයිස්තුවට අනුව එක් එක් ආයතනය යටතේ යාවත්කාලීන කරනු ලැබේ. ඒ අනුව අවශ්‍ය සියළු තොරතුරු කිසිඳු වෙනසකින් තොරව අනිවාර්යයෙන් ලබාදිය යුතුවන අතර සාවද්‍ය තොරතුරු ලබාදීම හා අවශ්‍ය තොරතුරු ලබාදීමට අපොහොසත් වීම මගින් අදාළ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම අපහසුවන අතර ම අග්‍රහාර හිමිකම් ගෙවීම් ප්‍රමාද වීමටත් හේතු විය හැක.

තවද මාසික ගිණුම් යාවත්කාලීන කිරීමේ හා අග්‍රහාර හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා, මාසික අවකරණ ලැයිස්තුව නිලධාරීන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය ඉංග්‍රීසි බසින් ඇතුළත් කර පහත ආකෘතිය පරිදි **Excel Work Sheet**මගින් සැකසූ මෘදු පිටපත් (Soft Copy)agrarevenue@nitf.lkඅපගේ විද්‍යුත් තැපැලට හෝ සංයුක්ත තැටියකට(CD)පිටපත් කර **මාසිකව** අප වෙත ලැබීමට සලස්වන්න. තවද සම්පූර්ණ කරන ලද මාසික චෙක්පත් තැන්පතු කුවිතාන්සිය චෙක්පතද සමඟ එවිය යුතුය. (**මුද්‍රිත**අවකරණ ලේඛනයන් එවීම අවශ්‍ය නොවේ.)

| NAME | NIC NO | FILE_NO | CHEQNO | AMOUNT | MONTH | YEAR | REMARK |
|---|---|---|---|---|---|---|---|
| A PERERA | 71xxxxxxxV | 04651 | 629877 | 600 | 12 | 16 | |
| M SILVA | 83xxxxxxxV | 04651 | 629877 | 300 | 12 | 16 | |

ඉහත චක්‍රලේඛනය පිළිබඳ යම් පැහැදිලි කිරීමක් අවශ්‍යනම් පහත දුරකථන අංක ඔස්සේ ආදායම් අංශ ප්‍රධානී අමතන්න. දු.ක:- 0112399299 දිගුව-512
0114873901- 5 දිගුව - 266

මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සනත් සී. ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරී
ජාතික රක්ෂණ භාර අරමුදල.